

> "නිදහස ලබා දශක හයක් ගතවී ඇති නමුත් තවමත් අපි කතා කරන්නේ ශ්‍රී ලාංකේය අනන්‍යතාවයක් ගොඩ නගාගැනීම ගැනය. එහෙත් තවම අපිට පොදු අනන්‍යතාවය ගොඩනගැනීමට නොහැකිවී තිබේ."

# ලාංකික අනන්‍යතාවය ගොඩනගා ගැනීමේ මාවත

භාෂාවක් යනු කිසියම් ව්‍යාකරණයක් සාදාගෙන අදහස් ප්‍රකාශය කරන මාධ්‍යයකි. භාෂාව සන්නිවේදන මාධ්‍යයකි. යම් භාෂාවක එම සමාජ කොට්ඨාසයේ සංස්කෘතිය ගැබ්වේ. අපි වෙනත් භාෂාවක් කතා කරන්නේ තමන්ගේ මව් භාෂාවේ ව්‍යවහාරය ඇතිවය. ඇමෙරිකාවේ හා එංගලන්තයේ ජනතාව ඉංග්‍රීසි කතා කරන ස්වරූපයේ හා ආසියාවේ ජනතාව කතා කරන ආකාරයේ වෙනස් කම් තිබෙන්නේ මේ මව් භාෂාවේ බලපෑම් නිසාය.

ලෝකයේ භාෂා දෙස බලන විට භාෂා අනන්‍යතාවයන් අටදහසක් පමණ තිබේ. මනුෂ්‍ය වර්ගයාගේ විවිධත්වය අඩුවීමට පටන්ගත්තේ විවිධ ජන කොටස් වඳවී යාම නිසාය.
විවිධ දේශපාලන ක්‍රියාකාරකම් හා වෙන්ත ජාතීන් සමග මිශ්‍ර නොවී සිටීම නිසා ඇතැම් ජාතීන් වඳවී යන ජාතීන් බවට පත්විය. මේ සම්බන්ධයෙන් හා භාෂාව සම්බන්ධයෙන් පර්යේෂණ කළ අය සොයාගත් කරුණක් වූයේ භාෂා වර්ග 500ක් පමණ කතා කරන ජන කොටස් වඳවී යන බවය. ඇතැම් භාෂා සංරක්ෂණය කර සංවර්ධනය කිරීමට කටයුතු කරන්නේ මේ නිසාය.

භාෂාව යනු මනුෂ්‍ය වර්ගයාගේ අනන්‍යාතවයේ වැදගත් ලකුණකි. මනුෂ්‍ය

සලකන බවට වන අදහසක් මතුවෙයි. ලෝකයේ බෙදුම්වාදයන් ඇතිවීමේ මූලික අවස්ථාව වන්නේ මෙයයි. ඒ ආකාරයට කොන්වන භාෂා හා සංස්කෘතීන්වලට අයත් ජනතාව තමන්ගේ අනන්‍යාතවය ආරක්ෂා කරගැනීමට නම් වෙන්වී ජීවත්විය යුතු බවට අදහස් මතුකරගන්නේ මේ අනුවය. අද තිබෙන ජාතික රාජ්‍ය දෙස බලන විට ජාතික රාජ්‍යයේ සියලුම පුරවැසියන්ට එක ජාතිකත්වයක් ලබාදීමට උත්සාහ ගනී. එවිට වෙනස් අනන්‍යතාවයන් සමග සම්මුතියක් ඇතිකරගන්නේ කෙසේද යන්න විසඳාගත යුතුය. එම අනන්‍යතාවයන් විනාශ කිරීමෙන් පසුව ජාතික අනන්‍යාතවයක් ගොඩනගාගත නොහැකිය. පොදු අනන්‍යතාවයක් ගොඩනගාගැනීමට හැකියාව ලැබෙන්නේ සියලුම භාෂා හා සියලුම සංස්කෘතීන්වලට පොදු ලක්ෂණ එක් කරගැනීමෙනි.

මනුෂ්‍යයා ලෝකයට බිහිවන්නේ කිසියම් අනන්‍යතාවයක් ඇතිවය. සියලුදෙනාටම ආගමක් සංස්කෘතියක් උපතින්ම හිමිවේ. මෙය ලැබෙන්නේ ස්වේච්ඡාවෙන් නොවේ. කිසියම් පවුලක උපත ලැබූ විට පවුලේ ආගම ඔහුට හිමිවේ. ඔවුන් කතා කරන භාෂාව තීරණය වන්නේ ඒ අනුවය. එය

සංකල්පයන් ඇතිවූයේද මේ ජාතික රාජ්‍ය නිර්මාණය වීමෙන් පසුවය. එහෙත් ඒ අතර සියලුම ජන වාර්ගවලට අයත් සංස්කෘතීන්, භාෂාවන් හා අනන්‍යතාවයන් මුල් කරගෙන පොදු අනන්‍යතාවයක් ගොඩ නගාගැනීමේ වැදගත්කම පිළිබඳවද මෙහිදී සාකච්ඡාවට ලක්විය. මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙන් භාෂාව මූලික මානව අයිතියක් සේ සලකා ඇත්තේ පොදු අනන්‍යතාවයක් ගොඩ නගාගැනීමේ අභිලාශය ඇතිවය.

විවිධ භාෂා විවිධ සංස්කෘතීන් ඇතිව අපි විශ්ව සමාජයක් පිළිබඳ කතා කරමින් සිටිමු. අපි සියලුදෙනාම අයිතිවන්නේ විශ්ව සමාජයටයයැයි අදහසක් තිබේ. අපි සියලුදෙනාම විශ්ව සමාජයේ සාමාජිකයෝය. අපි සියලුදෙනාම ලෝකයේ පුරවැසියන්ය. ලෝක පුරවැසියෙක් වන සෑම අයෙක්ටම සමාන මිනිස් අයිතිවාසිකම් තිබේය යන්න එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පිළිගනු ලැබුවද එය බොහෝ කාලයක් තිස්සේ වර්ධනය වූ සංකල්පයකි. ඒ නිසා එක් එක් භාෂාවන්, සංස්කෘතීන්ට ඇති අයිතිවාසිකම් එලෙසම තිබිය යුතුය. ඒවාට බාධාවන්

ලබාදීමටත් භාෂා දැනුම වැදගත්ය. ලංකාවේ නම වැනි වසර දක්වා සිංහල ළමුන්ට දෙමළ භාෂාවත්, දෙමළ ළමුන්ට සිංහල භාෂාවත් උගන්වනු ලැබේ. අපේ රටේ ව්‍යවස්ථාව අනුව සම්බන්ධීකරණ භාෂාව ලෙස ඉංග්‍රීසි භාෂාව දක්වා තිබේ. භාෂාව පිළිබඳ ව්‍යවස්ථාවේ විවිධ විධි විධාන තිබේ. සියලුම දරුවන් තමන්ගේ මව් බසින් අධ්‍යාපනය ලැබිය යුතු බව එහි දැක්වේ. රාජ්‍ය භාෂා දෙකක් හඳුන්වාදී තිබේ. පරිපාලන භාෂා දෙකක් ව්‍යවස්ථාවෙන් දක්වා තිබේ. භාෂා පිළිබඳ ව්‍යවස්ථාවේ ඇති ප්‍රතිපත්තිය බැලූ විට ත්‍රෛභාෂාවන්ගේ දැනුම අපේක්ෂා කරයි. ව්‍යවස්ථාව මගින්ම එම භාෂාවන් පිළිබඳ දැනුම අපේක්ෂා කරයි. ජනාධිපතිවරයා විසින් නම් කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ද්වි භාෂා පරිපාලන කොට්ඨාස ලෙස පවත්වාගෙන යා යුතුය. එම ප්‍රදේශවල සේවය කරන රාජ්‍ය සේවයකින් භාෂා දෙකක් දැන සිටිය යුතුය. ව්‍යවස්ථාවේ ඇති භාෂා අයිතිවාසිකම් යටතේ රාජ්‍ය සමග ගනුදෙනු කිරීමේදී තමන්ගේ මව් බසින් අදාළ ලේඛන ඉදිරිපත් කළ යුතුය. රාජ්‍ය භාෂා කොමිසම පත් කර ඇත්තේ භාෂාව පිළිබඳ ව්‍යවස්ථාවේ ඇති ප්‍රතිපාදන නිසි ආකාරයෙන් ක්‍රියාත්මක වන්නේද යන්න සොයා බැලීමටය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට ආණ්ඩුවේ ආයතන බැඳී සිටී. ඒ සඳහා වෙන්වූ අමාත්‍යාංශයක් ද මේ වන විට ස්ථාපිත කර තිබේ. අද සේවයට බැඳෙන රාජ්‍ය සේවකයින් වසර පහක් ඇතුළත දෙවැනි භාෂාවේ ප්‍රවීණතාවය ලබාගත යුතුය. එසේ නොවන්නේනම් රාජ්‍ය සේවකයින්ට වැටුප් වර්ධක ලබාගැනීමට නොහැකිය.

අපි අද කතා කරන්නේ ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගැනය. එය නිකරුනේ මතුවන්නේ නැත. එය මතුවන්නේ පුරවැසිභාවය සමගය. එය ඇතිවන්නේ ජාතීන් අතර සහයෝගීතාවය ඇතිවන ආකාරයේ රාජ්‍ය ප්‍රතිපත්ති ඇතිවිය යුතුය. සියලුම ජාතීන්ට, භාෂාවන්ට පිළිගැනීමක් ලැබෙන ආකාරයට රාජ්‍ය කටයුතු කළ යුතුය. අධ්‍යාපන ක්ෂේත්‍රයේදී පමණක් නොව සමාජ ක්ෂේත්‍රයේදී එම පිළිගැනීම ලැබිය යුතුය. ජාතීන් එකිනෙකාට වැළඳගන්නේ එසේ එක්වන්නේ නම් පමණි.

ඉදිරියට යන ලෝකය සමග ඉදිරියට යාමට රාජ්‍යයන් සමග ඇති පොදු අනන්‍යාතවයන්

කතා කිරීමෙන් පලක් නැත. ඊට පෙර ආණ්ඩුව ඒ පිළිබඳ අවධානය යොමුකිරීමට ගත් තීරණය රටක් වශයෙන් මේ මොහොතේ ගත යුතුවම තිබුණකි.

දැන් පාතාලය මැඩීමේ සම්පූර්ණ වගකීම පැවරී ඇත්තේ බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති පූජිත ජයසුන්දර මහතා වෙතය. ඒ අනුව එක් එක් පොලිස් කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයාට පූර්ණ අධීක්ෂණය පැවරේ. ඒ යටතේ පොලිස් පරීක්ෂකවරයකු, සැරයන්වරුන් දෙදෙනකු සහ කොස්තාපල්වරුන් සිව් දෙනකුට මෙහෙයුම් භාරවෙයි. ඔවුන්ට පොලිස් ජීප් රථයක් සේම අවශ්‍ය අවි ආයුධ ද දී තිබේ. පැය විසි හතර පුරාම ඔවුන් ක්‍රියාත්මක විය යුතුය. තමන්ගේ පොලිස් බල ප්‍රදේශයේ වන අපරාධ සම්බන්ධයෙන් මොවුන් ක්‍රියාත්මක විය යුතුය. ඊට අමතරව එකී ප්‍රදේශයේ සිටින පාතාල අපරාධකරුවන්, හෙරොයින් ජාවාරම්කරුවන් සේම ලියාපදිංචි අපරාධකරුවන් පිළිබඳ පුළුල් විමර්ශනයක් ද පැවරේ. හදිසි මාර්ග බාධක ද ක්‍රියාත්මක කළ හැකිය. මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට පොලිස් විශේෂ කාර්ය බලකායේ ද සහාය ලැබේ. පාතාලය මැඩීමටම මෙසේ පිහිටුවා ඇති විශේෂ ඒකකය වන්නේ පාතාල සන්නද්ධ කණ්ඩායම් මර්දනය කිරීමේ කොට්ඨාස මෙහෙයුම් ඒකකයයි.

හිසේ කෙස් ගණනට ඒකක පිහිටුවූවත් පොලීසිය සහ දේශපාලනය අතරත්, දේශපාලනය සහ පාතාලය අතරත් ඇති තුන් ඈඳුතු සම්බන්ධතාවය රටට රහසක් නොවේ. යහපාලන ආණ්ඩුව බලයට පැමිණිදා සිටම පාතාලය ක්‍රමයෙන් ශක්තිමත් වූ බව පැහැදිලිය. පැවැති ආණ්ඩුව පාතාලය මර්දනය කළේ විශේෂ ඒකක පිහිටුවීමෙන් නොවන බවද ජනතාව දනිති. එහෙත් පාතාලය භීතියෙන් වෙව්ලා ගිය අයුරුත්, පාතාල නායකයන් රට හැරපියා පලා ගිය අයුරුත් ජනතාව දනිති. මැඩු පිළිවෙත සම්බන්ධයෙන් බරපතල විවේචන එල්ල වූවත්, එකලදී පාතාලයට යන එන මං නැති විය. යහපාලන ආණ්ඩුවේ ප්‍රබල මැති ඇමැතිවරුන්ගේ ආශීර්වාදයෙන් පාතාල නායකයන් යළි මෙරටට පැමිණි අයුරුත්, අගෝස්තු මහ මැතිවරණයේ දී සෘජුව සම්බන්ධ වූ අයුරුත් ජනතාවට අමතක නැත. ජනතාව ආණ්ඩුවෙන් අපේක්ෂා කළ වෙනස එය නොවේ.

ජනාධිපතිවරයාත් අගමැතිවරයාත් ආරක්ෂක රාජ්‍ය ඇමැතිවරයාත් පාතාලය මැඩීම විශේෂ අවශ්‍යතාවක් සේ සලකා නව පොලිස් ඒකකයක් පිහිටුවීමට කටයුතු යෙදීම සම්බන්ධයෙන් ජනතා ප්‍රසාදය හිමිවිය යුතුය. ගැටලුව ඇත්තේ ක්‍රියාත්මක වන නොවන ආකාරය අනුවය. දේශපාලන හුරතලුන් වන පාතාලයන්ටත්, පාලක පැලැන්තියට විරුද්ධව සිටින පාතාලයටත් එකම හැන්දෙන් බෙදෙන්නේ නම් ජනතා අපේක්ෂාව එයයි. සොත්ති උපාලීලා හෝ කඩුවෙල වසන්තලා යහපාලනයෙන් නිර්මාණය නොවිය යුතුය. රටටත් ජනතාවටත් ඇවැසි භීතියෙන් සැකයෙන් තොර සාමකාමී රටක් මිස චිකාගෝවක් නොවේ. නීතියත් සාමයත් තහවුරු වූ යහපාලනයේ සැබෑ මුද්‍රාව තැබූ සමාජ වටපිටාවක් මිස, සුදු වෑන් හෝ අත්පා රහිත මිනී තැන තැන මතුවන, අනාරක්ෂිත භාවය රජයන දිනයක් හෝ නොවේ. පාතාලය පාතාලයක් සේ සලකා කටයුතු කරන පාලක පංතියක් මිස ආශිර්වාදයක් කරගත් පිරිසක් නොවේ. ජේම්ස් බොන්ඩ්ලා නොමැතිවාට, ඇඹිලිපිටිය, කොටදෙණියාව තිබුණාට, රටේ පොලීසිය ගැන ජනතාවට තවමත් යම් විශ්වාසයක් තිබේ. දැන් අවශ්‍යව ඇත්තේ එකී විශ්වාසය තහවුරු කිරීමයි.

---

භාෂාව යනු මනුෂ්‍ය වර්ගයාගේ අනන්‍යතාවයේ වැදගත් ලකුණකි. මනුෂ්‍ය වර්ගයාගේ විවිධත්වය ආරක්ෂා කිරීමට නොහැකි වුවහොත් මනුෂ්‍ය වර්ගයාගේ පැවැත්ම අනතුරට ලක්වන බව භාෂා විද්‍යාඥයින්ගේ අදහසයි. පරිසරයේ විවිධත්වය ආරක්ෂා කිරීමට නොහැකිවුවහොත් ඇතිවන තත්ත්වයට වඩා මනුෂ්‍යයාගේ විවිධත්වය නැතිවීමෙන් හානි සිදුවිය හැකිය.

මිනිසා යනු සමාජීය සත්වයෙකි. සමාජීය සත්වයෙක්ට සිය සමාජ තත්ත්වය පාලනය කරගැනීමට දේශපාලනය අවශ්‍ය වෙයි. සමාජය හා දේශපාලනය එක්වූ විට යුක්තිධර්ම දෙකක් මතුවෙයි. දේශපාලනය විසින් මතු කරන නීතියේ යුක්තිය හා සමාජය විසින් මතුකරන සමාජීය යුක්තිය නැතිනම් ස්වභාවික යුක්තිය එම කොටස් දෙකයි. මෙම යුක්තිධර්ම දෙක සමබර කරගැනීමට මිනිසාට සිදුවෙයි. එහි එක් අංගයක් වන්නේ භාෂාවයි.

භාෂාවක විවිධත්වය නැතිවී යාම යනු සංස්කෘතියේ විවිධත්වය නැතිවී යාමකි. අපේ අනන්‍යතාවය ආරක්ෂා කරගැනීමට නම් අනෙකාගේ අනන්‍යතාවය ආරක්ෂා කරගත යුතුය. එහෙත් කනගාටුවට කරුණ වන්නේ බොහෝ දෙනා අනෙකාගේ අනන්‍යතාවය හතුරෙක් සේ සැලකීමයි. අනෙකාගේ අනන්‍යතාවය නැතිවුවහොත් අපගේ අනන්‍යතාවය නැතිවී යන බව අවබෝධ කරගත යුතුය. භාෂාව පිළිබඳ ප්‍රශ්නය ගැන අවධානය යොමු කරන විට එසේ අනෙක් භාෂාව හා අනන්‍යතාවය හතුරෙක් සේ සලකන්නේ දේශපාලන හේතු නිසාය.

ජාතික රාජ්‍ය සංකල්පය පැමිණි විට රාජ්‍යයේ අවශ්‍යතාවය අනුව රාජ්‍ය භාෂාව, ජාතික භාෂාව, රාජ්‍ය ආගම යනුවෙන් වෙන් කිරීම් සිදුවිය. එයින් බැහැර කරන අය සැමවිටම අසතුටට පත්වෙයි. එයින් බැහැරවන භාෂාවන් කතා කරන අයට වෙනස් සේ

**එක් එක් භාෂාවන්, සංස්කෘතීන්ට ඇති අයිතිවාසිකම් එලෙසම තිබිය යුතුය. ඒවාට බාධාවන් ඇතිවිය යුතු නොවේ. ඒවා ආරක්ෂා කිරීම රාජ්‍යයේ යුතුකමයි. විවිධ ජන වර්ග අතර ගැටුම් ඇති නොවී අනන්‍යතාවයන් අතර සම්බන්ධතාවයන් ඇති කිරීම රාජ්‍යයේ වගකීමයි. සංහිඳියාව යැයි අප හඳුන්වන්නේ මෙයටයි. මේ නිසා භාෂාවන් හැදෑරීමේ හා භාෂාවන් ආරක්ෂා කිරීමේ වැදගත්කම යන කරුණු මතුවෙයි.**

කලින් තීරණය කරන ලද්දක් නොවේ.


එම අනන්‍යතාවයට ගැටලුවක් ඇතිවන අවස්ථාවකදී සිය අනන්‍යතාවය ආරක්ෂා කරගැනීම සඳහා ගැටුම් ඇතිකරගැනීම ස්වභාවිකය. අපි අනන්‍යතාවය දිනපතා ප්‍රතිනිෂ්පාදනය කරමින් සිටිමු. පවුල් සම්බන්ධතා, ජාතික උත්සව, ආගමික උත්සවය හරහා අනන්‍යතාවය ප්‍රති නිෂ්පාදනය කරමින් ඉදිරියට ගෙන යමින් සිටිමු. සිංහල අලුත් අවුරුද්ද අතීතයේදී සැමරූ ආකාරයට වෙනස් ආකාරයකට අද සමරයි. සංස්කෘතික ප්‍රති නිෂ්පාදනය සෑම ජාතියකම න්‍යෂ්ටියේ ඇති කරුණකි. ජාතිය යන්නට අද ජන වර්ගය යන නම ලබාදී තිබේ. රාජ්‍යය යන්නට ජාතිකත්වය යන්න ලබාදී තිබේ.

ජාතික රාජ්‍යයන් නිර්මාණය වීමත් සමග භාෂාවන්, ආගම් සංස්කෘතීන් බිය ගැන්වෙන ක්‍රියාවලියක් බවට පත්වී තිබේ. ප්‍රධාන එකක් හඳුනාගෙන ඔවුන් පිටුපස අනෙක් ජනවර්ග ධුරාවලියක් හඳුන්වාදීම, එක් ජාතියක් පමණක් වැදගත් යැයි කියමින් අනෙක් ජාතීන් විනාශ කිරීමේ

ඇතිවිය යුතු නොවේ. ඒවා ආරක්ෂා කිරීම රාජ්‍යයේ යුතුකමයි. විවිධ ජන වර්ග අතර ගැටුම් ඇති නොවී අනන්‍යතාවයන් අතර සම්බන්ධතාවයන් ඇති කිරීම රාජ්‍යයේ වගකීමයි. සංහිඳියාව යැයි අප හඳුන්වන්නේ මෙයටයි. මේ නිසා භාෂාවන් හැදෑරීමේ හා භාෂාවන් ආරක්ෂා කිරීමේ වැදගත්කම යන කරුණු මතුවෙයි.

අපේ රටේ ජාතික භාෂා ඇත්තේ දෙකකි. ඒ සිංහල හා දෙමළ භාෂා දෙකයි. ආදිවාසීන් තමන්ගේ භාෂාව ජාතික භාෂා ලෙස පිළිගන්නැයි ඉල්ලීම් කර නැත. මේ භාෂා දෙක අතර කිට්ටු සහසම්බන්ධයක් ඇති කළ යුතුය. ඔවුන් එකිනෙකාගේ භාෂා ඉගෙන ගැනීම ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමට හේතුවෙයි. ලංකාව ජන රජයකි. ජනරජයක සියලු පුරවැසියන්ටම අධ්‍යාපනය ලබාදීම රජයේ වගකීම යැයි දේශපාලන විද්‍යාඥයින්ගේ අදහසයි. නිදහස් මිනිසෙක් බිහිවන්නේ ඒ දැනුම අනුවය.

ඒ ඒ රටේ ජාතික සමගිය පවත්වාගෙන යාමට, ජාතීන් අතර අන්‍යෝන්‍ය අවබෝධය හා සංස්කෘතිය පිළිබඳ අවබෝධයක්




රාජ්‍යයන් සමග ඇති පොදු අනන්‍යතාවයන් ආරක්ෂා කරගත යුතුය. නිදහස ලබා දශක හයක් ගතවී ඇති නමුත් තවමත් අපි කතා කරන්නේ ශ්‍රී ලාංකේය අනන්‍යතාවයක් ගොඩ නගාගැනීම ගැනය. එහෙත් තවම අපිට පොදු අනන්‍යතාවය ගොඩනගැනීමට නොහැකිවී තිබේ. එහෙත් ඉන්දියාවේ තත්ත්වය ලංකාවට වඩා වෙනස්ය. ඉන්දියාවේ භාෂා දෙසීය පනහක් තිබේ. ඉන්දියාවේ අනන්‍යතාවය දෙස බලන විට එය ඉන්දියාවේ ප්‍රාන්ත 28ට වඩා වෙනස්ය. ඉන්දියාවෙන් පකිස්තානය වෙන්වූ පසුව තවදුරටත් එවැනි තත්ත්වයක් ඇති නොවීමට ඉන්දියාව තමන්ගේ ව්‍යවස්ථාව නිර්මාණය කරගත්තේය. 1947 සිට 1950 දක්වා ක්‍රියාත්මක වූ ඉන්දියානු පනතේ තිබූ ප්‍රාන්ත වෙන් කිරීම එලෙසම පවත්වා ගනිමින් ඉන්දියාව තමන්ගේ ව්‍යවස්ථාව නිර්මාණය කරගත්තේය. වෙනත් රටවල ව්‍යවස්ථාවන්හි අත්දැකීම් ලබාගත් ඉන්දියාව අභ්‍යන්තර වශයෙන් ඒකීය ලක්ෂණ ඇති භාවිතයෙන් පෙඩරල් ලක්ෂණ ඇති ව්‍යවස්ථාවක් නිර්මාණය කරගත්තේය. එහෙත් ඉන්දියාව කිසිදු අවස්ථාවක පෙඩරල් රාජ්‍යයක් යැයි කියන්නේ නැත. සන්ධීය ආණ්ඩුක්‍රමයක් යැයි කියන්නේ නැත. ඉන්දියාව සිය ව්‍යවස්ථාව නිර්මාණය කරන අවස්ථාවේදී භාෂා අනන්‍යතාවයන්, සංස්කෘතික අනන්‍යතාවයන් එය තුළට ඇතුළත් කරගැනීමට කටයුතු කරගත්තේය. ඉන්දියාවේ ජාතික කොඩිය නිර්මාණය කළේ නිදහස ලබාගන්නා යුගයේ දී භාවිත කළ පාට දෙකේ කොඩියට ධර්මාශෝක ලකුණ එක් කරගනිමිනි. නිදහස ලබාගැනීමේදී ඉන්දියාව භාරතය ලෙස නම් කළ යුතු බවට යෝජනා වූ විට නේරු එම හින්දි වචනයට කැමැති වූයේ නැත. හින්දි භාෂාවෙන් ගායනා කරන ජනප්‍රිය ජාතික අභිමානී ගීය වූ "වන්දේ මාතා"ගීය ජාතික ගීය බවට පත් නොකර වගං බසින් ගායනයා කරන "ජන මන" ගීය ජාතික ගීය ලෙස යොදාගත්තේය. ඉන්දියාව නිදහසින් පසුව රට ඉදිරියට ගෙන යාමට උත්සාහ කළේ සියලුම අන්‍යනතාවයක් එක් කරගනිමින් වාණිජ තලයේ ලබාගන්නා ජයග්‍රහණයන් තුළින්ය. ඉදිරි වසර විස්ස තුළ ලෝකයේ බලගතු රාජ්‍යයක් ලෙස ආර්ථික ශක්තියක් ඇතිව ඉදිරියට යාමට ඉන්දියාවට හැකි බවට වන ලකුණු පළ කර ඇත්තේ මේ ශක්තිය නිසාය.

ලංකාවේ අපි අවුරුදු ගණනක යුද ගැටුම් වලින් පසුව ඉගෙන ගත යුත්තේ ජාතික සංහිඳියාව ඇති කරග යුතු බවයි. අන්‍යෝන්‍ය වශයෙන් අපේ භාෂාවන් ආරක්ෂා කරගනිමින් අපිටම වූ ලාංකික අනන්‍යතාවයක් ගොඩනගාගැනීමයි. දෙමළ භාෂාව තමිල්නාඩුවේ කතා කළත් ලංකාවේ දෙමළ භාෂාවට අනන්‍යතාවයක් තිබේ. සිංහල භාෂාවට වෙනම අනන්‍යතාවයක් තිබේ. මේවා තවදුරටත් දියුණු කළ යුතුව ඇත. මෙම භාෂා දෙක අතර සංහිඳියාවක් ඇතිකරගන අතරවාරයේදී අපේ දරුවන්ට ජාත්‍යන්තර භාෂාවන් ඉගැන්විය යුතුව තිබේ. අපි භාෂා ප්‍රශ්නය ලෙස 1956දී සාකච්ඡා කළ ප්‍රශ්නයට වඩා වෙනස් අකාරයෙන් මේ දෙස අපි දැන් බැලිය යුතුය. එසේ නොවන්නේනම් අපිට සැමදා ගැටුම් ඇතිකරගනිමින් විඳවීමට සිදුවනු ඇත.

මේ සඳහා රජයට පමණක් වගකීම් පැවරිය හැකි නොවේ. පුද්ගලික අංශයටත් සිවිල් සමාජයත් මේ සඳහා අවධානය යොමු කළ යුතුව ඇත. අප අනෙකාගේ භාෂාව ඉගෙන ගන්නවා යනු අනෙකාගේ සංස්කෘතිය ඉගෙන ගැනීමකි. එමගින් ජාතික අනන්‍යතාවය ගොඩ නැගීමේ ප්‍රශ්නයේ විශාල කොටසක් මේ ගැන අවධානය යොමු කිරීමෙන් විසඳාගැනීමට හැකිය.


**ජාතික භාෂා අධ්‍යයන ආයතනයේ සභාපති**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා අධ්‍යයන අංශ ප්‍රධානී**
**මහාචාර්ය නවරත්න බණ්ඩාර**